දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA
තැ.පෙ.43/தபால் பெட்டி 43 /P.O.Box 43
පරණ ගලහ පාර, පේරාදෙණිය, ශ්‍රී ලංකාව
பழைய கலகா வீதி, பேராதனை, இலங்கை
Old Galaha Road, Peradeniya, Sri Lanka

මගේ අංකය: / எமது இலக்கம்: / My Ref:

ඔබේ අංකය: / உமது இலக்கம்: / Your Ref:

---

2026-03-30

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ සියලුම බාහිර උපාධි අපේක්ෂකයන් වෙත,

ප්‍රිය උපාධි අපේක්ෂකයිනි,

**<u>උපාධි ප්‍රදානෝත්සවය (බාහිර) - 2024/25</u>**

01 ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - (පැරණි නිර්දේශය හා නව නිර්දේශය යටතේ) සමත් සහ ව්‍යාපාර පරිපාලනවේදී උපාධි පරීක්ෂණය - (පැරණි නිර්දේශය හා නව නිර්දේශය යටතේ) සමත් උපාධි අපේක්ෂකයන් සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය **2026 ජූනි මස 02** වන දින **පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මහින්ද රාජපක්ෂ ශ්‍රවනාගාරයේදී** පැවැත්වීමට නියමිතය.

02 මෙම උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලැබීමට සුදුසුකම්ලත් උපාධි අපේක්ෂකයන් මේ සමඟ CDCE වෙබ් අඩවියේ උඩුගත (upload) කර ඇති අයදුම් පත්‍රය බාගත (download) කර එහි සඳහන් තොරතුරු සම්පූර්ණ කර **( අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබගේ ක්‍රියාකාරී දුරකථන අංක සහ විද්‍යුත් ලිපිනය (email) සඳහන් කර එවීම අනිවාර්යය වේ) 2026-04-27** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **<u>"උපාධි ප්‍රදානෝත්සවය (බාහිර) - 2024/25"</u>** යනුවෙන් සඳහන් කර **<u>"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, නො. 43, පරණ ගලහ පාර, පේරාදෙණිය"</u>** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (බාගත කරන ලද අයදුම් පත මුද්‍රණය කිරීමේදී A4 කොළයක දෙපැත්තෙහි මුද්‍රණය කිරීමට කාරුණික වන්න).

**Link:** https://cdce.pdn.ac.lk/tools/convo

03 සහතික පත්‍ර ගාස්තු සහ උපාධි ප්‍රදානයට අදාල සියලුම වියදම් ආවරණය කර ගැනීම සඳහා **රු. 10,000/-** ක් වන ගාස්තුව **උපාධි උත්සවයට සහභාගි වන සහ සහභාගි නොවන** සියලුම උපාධිධාරීන් විසින් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් **පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අංක <u>057-1-001-4-1338036</u>** දරන ගිණුමට බැර කර මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සියේ **(Orginal Cash Deposit Slip)** මුල් පිටපත සමඟ ඔබ විසින් සම්පූර්ණ කර මුද්‍රණය කරන ලද අයදුම් පත්‍රය අප වෙත එවීම අනිවාර්ය වේ. (ඡායාරූප සඳහා අයකරනු ලබන ගාස්තු මීට ඇතුළත් කර නොමැති බව කරුණාවෙන් සලකන්න)

- මින් ඉදිරියට උපාධි ප්‍රදානෝත්සවයට අදාල විස්තර අපගේ CDCE වෙබ් අඩවියේ **https://cdce.pdn.ac.lk/** පළකරනු ලබන අතර ඔබ විසින් අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති දුරකථන අංක, email ලිපිනය ඔස්සේ උපාධි ප්‍රදානෝත්සවයට අදාල පණිවුඩ දැනුම්දෙනු ලැබේ. එබැවින් එම අංක සහ email ලිපිනය නොවෙනස්ව පවත්වා ගෙන යන ලෙසත් උපාධි ප්‍රදානෝත්සවයට සම්බන්ධ email පණිවුඩ cdceconvocation@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙසත් දන්වා සිටිමි.

ජේ.පී. වෙස්ලි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය